NIKOLAÏ NOSOV

නිකොලායි නෝසෝව්

සිහින දකින්නෝ



මිෂුත්කා සහ ස්තාසික් උයනේ බංකුවක වාඩිවී කතා කරමින් සිටියා.
ඒත් ඔවුන් අනෙක් ළමයින් වගේ සරළ භාෂාවෙන් කතා කළේ නෑ.
ඔවුන් බොරු කියමින් සිටි අතර එය පෙනුණේ පළමුවෙන්
ලොකු ම බොරුව කියන්න පුළුවන් කාටද කියලා බලන තරඟයක්
ඔවුන් අතර ඇතිවා වගෙයි.

“ඔයාගේ වයස කීයද?” මිෂුත්කා ඇහුවා.
මට අනූ පහක්, එකකොට ඔයාගෙ? ස්තාසික් ඇහුවා.
මට වයස අවුරුදු එකසිය හතලිහයි. මිෂුත්කා කියනවා.
“මම ඉස්සර බෝරියා මාමා වගේ ගොඩක් ලොකුයි.
ඒත් පස්සෙ මම පුංචි වුණා”.

“මම” ස්තාසික් කියනවා.
“ඉස්සර වෙලා පුංචියට හිටියා.
පස්සෙ ලොකු වුණා.
පස්සෙ ආයෙමත් පුංචි වුණා.
දැන් මම ආයෙමත් ළඟදි ලොකු වෙනවා.”



"මම ලොකුවට හිටපු කාලෙ මට ගඟ හරහා පීනන්න පුළුවන්."
මිෂුත්කා කියනවා.
"හ්ම්! මට මූද හරහා පීනන්න පුළුවන් වුණා."
"අහන්නකො, මූදෙ! මම සාගරය හරහා පීනුවා!"



“මට ඉස්සර ඉගිලෙන්න පුළුවන්.”
“හ්ම්, එහෙනං ඉගිල්ලෙන්න!”
“දැන් බෑ: මට මතක නෑ.”

“දවසක් මම මුදෙ නෑවා.” මිෂුත්කා කියනවා. “එතකොට ලොකු මෝරෙක් මාව කන්න පැන්නා. මම ඌට මිට මොලවල ගැහුවා. මෝරා මගෙ ඔළුව හපල කෑවා.”
“ඔයා බොරු කියනවා.”
“නෑ සහතික ඇත්ත!”
“ඉතින් මොකද ඔයා මැරුණෙ නැත්තෙ?”
“මක්කටද මැරෙන්නෙ? මම වෙරළට පීනලා ගෙදර ගියා.”
“ඔළුව නැතුව?”
“සත්තයි, ඔළුව නැතුව. මක්කටද ඔළුව?”
“ඉතින් කොහොමද ඔයා ඔළුව නැතුව ගියේ?”
“මම ගියා ඔළුව නැතුව. මොකද, ඔළුව නැතුව යන්න බැරිද!”
ඉතින් කොහොමද ඔයාට දැන් ඔළුවක් තියෙන්නෙ?”
“අළුතින් ඔළුවක් ආවා.”



"අපූරු සිතුවිල්ලක් තමයි!" ස්තාසික්ට ඉරිසියා හිතුණා. ඔහු හිතුවා මිෂුත්කාගෙ බොරුවට වැඩියෙන් හොඳ බොරුවක් කියන්න.
"අපෝ, ඒක මොකක්ද!" ඔහු කීවා. "වතාවක් මම අප්‍රිකාවට ගියා. එහිදී මාව කිඹුලෙක් ගිල්ලා."

“ඔන්න කීවා බොරුවක් !” මිෂුත්කා සිනාසුණා.
“සහතික ඇත්ත.”
“ඉතින් මොකද ඔයා පණ පිටින්?”
“පස්සෙ ඌ මාව වමෑරුවා.”
මිෂුත්කා හිතන්න පටන් ගත්තා. ඔහුට ඕනෑ කළා ස්තාසික් පරද්දන්න. ඔහු හිතුවා, අන්තිමේදී කියනවා: “දවසක් මම පාරෙ ගියා. වටේට ට්‍රාම්කාර්, ලොරි, බස්.....



“දන්නව, දන්නව! ස්තාසික් කෑ ගැහුවා. “දැන් ඔයා කියයි ට්‍රාම්කාර් එක ඔයා යට කර ගෙන ගියයි කියල. ඔයා ඒ ගැන දැනටම කියල.”
“නෑ එහෙම එකක් නෙවෙයි. ඒක නෙවෙයි.”
“හා, කමක් නෑ. බොරුව කියනවා.”
“ඉතින් මම යනවා කිසි කෙනෙකුගෙ ඇඟේ හැප්පෙන්නෙ නැතුව. එක පාරටම බස් එකක් මට හම්බ වුණා. මම ඒක ගණන් ගත්තෙ නෑ. මම කකුලෙන් පැගුවා. 'බ්ර්රාස!' බස් එක පොළොවටම චප්ප වුණා.”
“හා: හා: හා! ඔන්න ඕක බොරුවක්!”
“නෑ, ඒක බොරුවක් නෙවෙයි!”
“කොහොමද බස් එකක් චප්ප කර දමන්නෙ?”
“ඒක හරි පුංචියි. සෙල්ලම් බස් එකක්. එක පුංචි ළමයෙක් ලණුවකින් ඇද ගෙන ගියා.”



මේ අතර ළඟ ගෙදරක වසන ඊගර් ඇවිත් බංකුවේ වාඩි වුණා.
ඔහු මිෂුත්කාට හා ස්තාසික්ට කන් දුන්නා. කන්දීලා කියනවා:
“අපෝ කියන බොරු! ඔයාලට ලැජ්ජා නැද්ද?
“අපි කාවත් රවට්ටන්නෙ නෑ” ස්තාසික් කීවා. “අපි එක එක කතන්දර හදලා කියනවා.” “කතන්දර! ඊගර් ඕච්චම් කලා.
“අපූරු වැඩක් හොයාගෙන.”
“ඔයා හිතන්නෙ කතන්දර හදන්න ලෙහෙසියි කියලද?”
“මොකෝ අමාරු!”
“හොඳයි, එහෙනම් මොකක් හරි කතන්දරයක් හදන්න.”
“ටිකක් ඉන්න.....” ඊගර් කීවා.
මිෂුත්කා හා ස්තාසික් බොහොම සතුටුවෙලා ඇහුම්කන් දෙන්න සූදානම් වුණා.
“ටිකක් ඉන්න” ඊගර් ආයෙමත් කීවා. “මේ - මේ - මේ....”

“මොකද, ඔක්කොම ‘මේ’- ‘මේ’ ”
“ටිකක් ඉන්න: මට හිතන්න දෙන්න.”
“හොඳයි. හිතන්න, හිතන්න.”
ඊගර් “මේ-මේ” කියල අහස දිහා බැලුවා. “ටිකකින්.... ටිකකින්....”
“මොකෝ ඔයාට කතන්දරයක් හදන්න බැරිද? නමුත් කියනව මොකෝ අමාරු කියල.”
“ඔන්න.... අහන්න! දවසක් මම බල්ලෙකුට උහුළු විහිළු කෙරුවා. එතකොට ඌ එකපාරටම පැනල මගෙ කකුල හැපුවා. මේ බලන්න, තවම පලුද්ද තියනවා.”
“මොකක්ද එකෙ අපූරුව?” ස්තාසික් ඇහුවා.”
“මොකුත් නෑ. ඒ වුණු හැටියටම මම කීවා.”
“ඉතින් කියනවා කතන්දර හදන්න හපනෙක් කියල!”
“මම හපනෙක් තමයි. නමුත් ඔයගොල්ලො වගේ හපනෙක් නෙවෙයි. ඔය ගොල්ල ඔක්කොම කියන්නෙ පලක් නැති බොරු. ඊයෙ මම බොරුවක් කීවා. ඒකෙන් මට වාසියක් වුණා.



“මොන වාසියක්ද?”

“මෙන්න මේකයි. ඊයෙ හවස අම්මයි තාත්තයි ඇවිදින්න ගියා. ගෙදර හිටියෙ මමයි ඊරායි. ඊරා නිදාගන්න ගියා. මම කෑම කාමරේට ගිහිල්ලා ජෑම් බෝතලේ බාගයක්ම කෑවා. ඉතින් මාව අහු නො වෙන වැඩක් මම කල්පනා කළා. මම කරපු වැඩේ ඊරාගෙ තොල්වල ජෑම් ගෑවා. අම්මා ඇවිල්ල ඇහුවා, කවුද ජෑම් කෑවෙ කියල. මම කීවා ඊරා කියල. අම්මා ගිහින් බැලින්නම් ඊරාගෙ තොල් පුරාම ජෑම්. අද උදේ අම්ම ඊරාට බැන්නා, මට තවත් ජෑම් දුන්නා. ඔන්න වාසිය.”

"ඒ කියන්නෙ ඔයා හින්ද කවුරුවත් බැණුම් අහන එක ඔයාට සතුටක්!"
මිෂුත්කා කීවා.
"ඉතින් ඔයාට මොකෝ?"
"මට මොකුත් නෑ, ඔයා.... මොකක්ද ඒ අයට කියන්නෙ? පචයා! ඔන්න!
"ඔය ගොල්ලො තමයි පචයෝ!"
"යනව යන්න. අපි කැමති නෑ, ඔයා එක්ක බංකුවේ ඉන්න."
"මම කැමති නෑ. ඔයගොල්ලො එක්ක බංකුවේ ඉන්න."
ඊගර් නැගිට යන්න ගියා. මිෂුත්කා හා ස්තාසික් ද ගෙදර යන්න ගියා.
පාර දිගේ යනකොට ඔවුන් දැක්කා අයිස්ක්‍රීම් විකුණන තැනක්, නැවතිලා
සාක්කු අත ගාලා බැලුවා, කොච්චර සල්ලි තියෙනවද කියල. දෙන්න ළඟම
තිබෙන සල්ලි වලින් එක අයිස් ක්‍රීම් කෑල්ලයි ගන්න පුළුවන්.
"එකක් අරගෙන දෙන්න බෙදා ගමු." ස්තාසික් යෝජනා කළා.
අයිස් ක්‍රීම් වෙළෙන්දිය ඔවුන්ට අයිස්ක්‍රීම් කෑල්ලක් දුන්නා.
"අපි ගෙදර යමු" මිෂුත්කා කිව්වා. "ගෙදර ගිහින් පිහියකින් කපමු.
හරියටම හිටින්න." "යමු."



ඔවුන් ගෙදර යනකොට පඩිපෙළේදී ඊරා හම්බ වුණා. ඈ හිටියෙ අඬපුගමන්.
“මොකද, ඔයා ඇඬුවෙ? මිෂුත්කා අහනවා.
“අම්මා මට සෙල්ලම් කරන්න යන්න දුන්නේ නෑ.”
“මොනව හින්දද?”
“ජෑම් වගයක් හින්ද, මම ජෑම් කෑවෙ නෑ. ඊගර් කියල මම කෑවා කියල. බාගදා ඊගර් ම කාලා, මම කෑවයි කියන්න ඇති.”
“සහතිකට ඊගර් තමයි කෑවෙ. එයා ම අපි එක්ක කයිවාරු කීවා. ඔයා අඬන්න එපා. මම ඔයාට මගෙ අයිස්ක්‍රීම් පංගුව දෙන්නම්”
මිෂුත්කා කීවා.



"මමත් ඔයාට මගේ අයිස්ක්‍රීම් කොටස දෙන්නම්
එක පාරක් රස බලන්න." ස්තාසික් පොරොන්දු වුණා.
"ඔයා කන්න කැමති නැද්ද?"
"නෑ අපි අද අයිස්ක්‍රීම් දහය බැගින් කෑවා." ස්තාසික් කිව්වා.
"මේ අයිස්ක්‍රීම් එක කොටස් තුනකට බෙදමු,
එක තමයි හොඳ ම" ඊරා යෝජනා කළා.
"හරි!" ස්තාසික් කිවුවා. "ඔයා අයිස්ක්‍රීම් ඔක්කොම කෑවොත්,
ඔයාගෙ උගුර රිදෙයි."

ඔහු ගේ ඇතුළට ගිහින් අයිස්ක්‍රීම් එක කොටස් තුනකට බෙදුවා.
“අහා! ඒක හරි ම රසයි.” මිෂුත්කා කිවුවා.
“මම අයිස්ක්‍රීම්වලට ගොඩක් කැමතියි. එක පාරක් මම අයිස්ක්‍රීම් බාල්දියක් කෑවා.”
“අහ්! ඔයා බොරු කියනවා.” ඊරා හිනා වෙලා කිවුවා.
“ඔයා අයිස්ක්‍රීම් බාල්දියක් කෑවා කියලා කවුද විශ්වාස කරන්නෙ?”
“ඇත්ත නමුත් ඒක හරි ම පොඩියි. කාඩ්බෝඩ් වලින් හදලා තිබුණෙ. පොඩි වීදුරුවක් තරම් ලොකුයි...”

සිහින දකින්නෝ

නිකොලායි නෝසෝව්

ළමා මනස පරිකල්පනයේ සීමාවන් පුළුල් කරගන්නේ අපූර්වතම ආකාරයන්ගෙන් ය.
එකී නිර්මාණාත්මක චින්තනයේ අපූර්වත්වයෙන් මෙම පොත පිරී ඇත



කඩුල්ල ප්‍රකාශන
Kadulla Publication (Pvt.) Ltd.
240/3, පහළ බියන්විල, කඩවත
011 2 92 69 69 / 077 2 58 39 42
E-mail: kadullabooks@gmail.com

ISBN 978-624-6555-41-2

රු. 400.00